# 1930 දශකයේ දේශපාලන බලවේගයක් ලෙස සූරියමල් ව්‍යාපාරයට හිමි වන වැදගත්කම

ඩී. ජේ. කේ. ඉහලගෙදර

කථිකාචාර්ය, මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය,
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ
Ihalagedara@yahoo.com

## හැඳින්වීම

සියවස් එක හමාරක් පමණ වූ ලංකාවේ බ්‍රිතාන්‍ය පාලනයට දේශීය වශයෙන් විරෝධතා එල්ලවීම ආරම්භ කෙරුනේ බ්‍රිතාන්‍ය පාලනය ලංකාවේ ආරම්භ වී වසර ගණනාවක් ගතවීමෙන් අනතුරුවය. විසිවන සියවස ආරම්භ වන විට සුලු වශයෙන් ආරම්භ වූ බ්‍රිතාන්‍ය විරෝධී අදහස් ක්‍රම ක්‍රමයෙන් වර්ධනය වන්නට පටන් ගත්තේය. ඒ අනුව එක්දහස් නවසිය තිහේ දශකය වන විට ලංකාවේ බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී පාලනයට විරුද්ධව එල්ලවූ විරෝධතා උත්සන්න වී තිබුණි. දේශපාලන උද්ඝෝෂණ, තරුණ පිබිදීම්, කම්කරු පිබිදීම් ආදිය තුළින් "දේශීයත්වය" යන්න වඩ වඩාත් ලාංකික ජනතාව තුළ අවධාරණය කෙරුණු අතර, දේශීයත්වය අගය කළ පිරිස් අධිරාජ්‍යවාදයට එරෙහිව නොයෙකුත් ව්‍යාපාර දියත් කළහ. එවැනි විරෝධතාවන්ට සුදුසු පරිසරය සැකසුණේ ද අධිරාජ්‍යවාදීන්ගේ ක්‍රියාකලාපයන් තුළිණි. අධිරාජ්‍යයේ යහපතට හා දේශීය ජනතාවගේ යහපත ලෙස පෙන්වා දෙමින් බ්‍රිතාන්‍ය පාලකයින් විසින් අනුගමනය කරන ලද ක්‍රියා පිළිවෙත් දේශීය ජනතාව ග්‍රහණය කර ගනු ලැබුවේ විවිධාකාරයෙනි. බ්‍රිතාන්‍ය පාලකයින්ගේ පාලන ප්‍රතිපත්ති කෙරෙහි සතුටුදායක ප්‍රතිචාරයක් දැක්වූ ලාංකික සුළු පිරිසක් ද, අසතුටුදායක වූවන් බහුතරයක් ද වූහ. කෙසේ වෙතත් බ්‍රිතාන්‍ය පාලනය නොඉවසූවෝ මෙලෙස අධිරාජ්‍යවාදයට එරෙහි ව්‍යාපාර ගෙනයාමට පෙළඹුණාහ. 1930 දශකයේ ආරම්භ වූ "සූරියමල් ව්‍යාපාරය" ද එවැන්නකි. ඉන් පිළිබිඹු වූයේ ද අධිරාජ්‍ය විරෝධී බවය. එය අධිරාජ්‍යවාදීන්ගේ "පොපිමල් ව්‍යාපාරයට" එරෙහිව නැගී ආ එකකි. පොපි මල් ව්‍යාපාරය වූ කලී අධිරාජ්‍යවාදීන්ගේම ව්‍යාපාරයක් විය.

## අධ්‍යයනයේ වැදගත්කම

"සූරියමල් ව්‍යාපාරය" යන මාතෘකාව ඔස්සේ පර්යේෂණාත්මක අධ්‍යයනයක් කිරීමේදී, එය විවිධ දෘෂ්ටීන් අනුව සළකා බලා, ඒ යටතේ අධ්‍යයනය කළ හැකි බව ප්‍රකාශ කළ යුතුය. එය එක් අතෙකින් වාමාංශික ව්‍යාපාරයට දැඩි සේ සම්බන්ධ කරමින්, වාමාංශික ව්‍යාපාරයේ ගමන් මග ඔස්සේ විග්‍රහ කළ හැකිය. නැතහොත්, විවිධ සමාජ ව්‍යාපාරයන් හා සසඳා බැලීමෙන් සමාජ ව්‍යාපාරයක ස්වරූපයෙන් අධ්‍යයනය ගොඩ නැංවිය හැකිය. එසේම ග්‍රාමීය සමාජය සමග සම්බන්ධ කරමින් ව්‍යාපාරයේ ගමන් මග පිළිබඳව කරුණු ගොනු කළ හැකිය. තවත් අතෙකින් අධිරාජ්‍ය විරෝධී බලවේගයක ස්වරූපයෙන් අධ්‍යයනයට ලක්කළ හැකිය. එබැවින් මෙම පර්යේෂණයේදී එම පාර්ශවයන් සියල්ලක්ම සළකා බලා, දේශපාලන බලවේගයක ස්වරූපය වඩාත් අවධාරයණය කරමින් මේ පිළිබඳව අධ්‍යයනය කිරිමට බලාපොරොත්තු වේ. සූරියමල් ව්‍යාපාරය, නවසිය තිහේ දශකයේ දේශපාලන බලවේගයක් ලෙසින් හඳුනාගනිමින් අධ්‍යයනය සිදු කරනු ලැබේ.

## පර්යේෂණ ගැටලුව

නවසිය තිහේ දශකයේ දේශපාලන බලවේගයක් ලෙස සූරියමල් ව්‍යාපාරයට හිමිවන වැදගත්කම.

## සාකච්ඡාව

සූරියමල් ව්‍යාපාරයට ඇත්තේ ඉතා කෙටි කාලීන ඉතිහාසයකි. එය 1931 වසරේ ඇරඹී, 1940 වසර වන විට මෙරට දේශපාලන ක්ෂේත්‍රයෙන් ඉවත්වීමට ගත වූයේ වර්ෂ 9 ක් පමණ වූ කෙටි කාලයකි. නමුත් එම කෙටි කාල වකවානුව තුළ වුවද, මෙරට දේශපාලන ක්ෂේත්‍රයට ඉන් සිදුවූයේ විශාල සේවාවකි. එම කෙටි කාලය තුළ සූරියමල් ව්‍යාපාරය මගින් දේශයේ නිදහස් සටනට අවශ්‍යව තිබූ පිරිස් බලය, නායකත්වය හා මාර්ග උපදේශනයන් ලබා දෙමින් මෙන්ම දේශපාලන ශක්තිය ලබා දීමෙන් කළා වූ සේවාව අතිමහත්ය. එපමණක් නොව, මෙරට වාමාංශික පෙරමුණ ශක්තිමත් පදනමක පිහිටුවීමෙහිලා 1935 ආරම්භ කරන ලද "ලංකා සමසමාජ පක්ෂයේ" මුල් බීජය වූයේ ද සූරියමල් ව්‍යාපාරයයි.

එක්දහස් නවසිය තිහේ දශකය වන විට මෙරට උත්සන්නව පැවති අධිරාජ්‍ය විරෝධී අරගලයේ නිදහස් සටන් පෙරමුණු අතර, සූරියමල් ව්‍යාපාරය කැපී පෙනෙන ආකාරයේ අධිරාජ්‍ය විරෝධී බලවේගයක ස්වරූපයක් පල කළේය. ජාතික නිදහස දිනා ගැනීමේ සටන් පෙරමුණට නවසිය තිහේ දශකය ආරම්භයේ එක් වූ ඉතාම ප්‍රබල මෙන්ම නව අදහස් වලින් සමන්විත දේශපාලන බලවේගය ලෙස සූරියමල් ව්‍යාපාරය හඳුන්වා දිය හැකිය. "නවසිය තිහේ දශකයේ දේශපාලන බලවේගය - සූරියමල් ව්‍යාපාරය" යන මාතෘකාව තුලින් ව්‍යාපාරයේ ආරම්භය, එහි නායකත්වය සහ දේශපාලන ස්වරූපය, ගමන් මඟ සහ එහි වැදගත්කම යනාදිය කෙරෙහි අවධානය යොමු කිරීමක් සිදුවේ.

පළමුවන ලෝක යුද්ධයෙන් අනාථ වූ සොල්දාදුවන්ට ආධාර සැපයීම සඳහා අවශ්‍ය අරමුදල් එකතු කිරීමට " පොපිමල් ව්‍යාපාරය" නම් වූ ව්‍යාපාරයක් යුරෝපා රාජ්‍යයන් අතර පැතිර ගියේය. 1920 පමණ වන විට බ්‍රිතාන්‍යය, ප්‍රංශය, ජර්මනිය වැනි රටවල පැතිරගිය මෙම ව්‍යාපාරය සිය යටත්විජිතයන්හිද ව්‍යාප්ත කිරීමට බ්‍රිතාන්‍ය විසින් උත්සාහ කරන ලදී. ඒ අනුව එවකට බ්‍රිතාන්‍යයේ පූර්ණ යටත් විජිතයක්ව පැවති ලංකාවේද පොපිමල් ව්‍යාපාරය ව්‍යාප්ත කිරීමක් සිදුවිය. 1930 ආරම්භ වන විට පොපිමල් ව්‍යාපාරය ලංකාවේ සීඝ්‍රයෙන් පැතිර යමින් තිබුණි. බ්‍රිතාන්‍යයන්ගේ එම පොපිමල් ව්‍යාපාරයට එරෙහි බලවේගයක් වශයෙන් " සූරියමල් ව්‍යාපාරය" මෙරට ආරම්භ කෙරිණ.

මෙම ව්‍යාපාරය ආරම්භක අවස්ථාවේ ප්‍රකාශ කළේ අධිරාජ්‍ය විරෝධී බව පමණි. නමුත් දෙවන අවස්ථාව වනවිට අධිරාජ්‍ය විරෝධී බව සමඟ එක්වූ පුළුල් සංකල්පයන් ව්‍යාපාරය තුළින් ගම්‍ය විය. සූරියමල් ව්‍යාපාරයට නිසි නායකත්වයක් ලැබුණේද, මෙරට වැඩි දෙනාගේ අවධානය ව්‍යාපාරය කෙරෙහි යොමුවූයේ ද, මෙම අවස්ථාවේදීය. මෙහිදී තරුණ සංගම් ව්‍යාපරය කෙරෙහි විශේෂ අවධානයක් යොමුකළ යුතුය. මක් නිසාද, තරුණ සංගම් ව්‍යාපාරය නවසිය තිහේ දශකයේ අධිරාජ්‍ය විරෝධී සටන් පෙරමුණට ශක්තිමත් අත් වැලක් වූ බැවිනි. අධිරාජ්‍ය විරෝධී ස්වරූපය සමඟ, වාමාංශික අදහස් ද, ව්‍යාපාරය තුළින් ඉස්මතු වන්නේ මෙම අවස්ථාවේදීය.

සාමාන්‍ය ජනතාව මුහුණපාන සමාජ, ආර්ථික හා සංස්කෘතික ප්‍රශ්ණ සමඟ ග්‍රාමීය සමාජය තුළ පැවති ප්‍රශ්ණ කෙරෙහි බ්‍රිතාන්‍ය පාලකයින්ගේ සහ දේශීය ප්‍රභූන්ගේ අවධානය යොමු කෙරෙන ක්‍රියාමාර්ග ගැනීමට සූරියමල් ව්‍යාපාරයේ නායකයෝ පියවර ගත් බව පෙනේ. නිදහස හා සාමය පමණක් නොව, ප්‍රජාතන්ත්‍රවාදය හා සමාජ සාධාරණත්වය ද එක්ව ගමන් කළයුතු බව ඔවුහු අවධාරණය කළහ. ලංකා සමසමාජ පක්ෂය බිහි වීමත් සමඟ ව්‍යාපාරයේ අරමුණු එය හා බැඳීමක් සිදු විය.

සූරියමල් ව්‍යාපාරය, කාන්තාව දේශපාලන ක්ෂේත්‍රයට යොමුකරවූ බලවේගයක් ද විය. දේශීය සමාජයේ කාන්තාවට හිමිවී තිබුණු සීමිතතාවයන්ට, සාම්ප්‍රදායික තත්ත්වයන් හා සම්මතයන් වලට, කිසියම් අභියෝගයක් මෙමගින් සිදු කෙරෙන බවද පෙනේ. මෙරට, කාන්තා දේශපාලනයට යොමුවීම පිළිබඳව අවධානය යොමුකරන විට සූරියමල් ව්‍යාපාරයෙන් සිදු වූ සේවාව ද බොහෝ අගය කළ යුතුය.

## නිගමනය

වර්තමාන දේශපාලන ක්ෂේත්‍රය පිළිබඳව සළකා බලන විට සූරියමල් ව්‍යාපාරය මඟින් ලබා දුන් ආදර්ශයන් අමතක කළ නොහැකිය. විශේෂයෙන් උතුරේ පැවති යුද්ධය කෙරෙහි අවධානය යොමුකරන කල,

එවැනි ව්‍යාපාරයක අවශ්‍යතාව වඩාත් පැහැදිලිය.

වර්තමාන දේශපාලන ක්ෂේත්‍රය තුළද, වාමාංශික අදහස් ප්‍රබල බලපෑමක් වී පවතින බව පෙනේ. එම වාමාංශික අදහස් වන මුල් බීජයන් වැපිරී ගියේ සූරියමල් ව්‍යාපාරය ඔස්සේය. එහෙයින් සූරියමල් ව්‍යාපාරය, සූරියමල් ව්‍යාපාරයේ වැදගත්කම වර්තමානයේ දී ද අමතක කළ නොහැකිය. වර්තමාන සමාජය තුළද, සූරියමල් ව්‍යාපාරය වැනි දේශපාලන ක්‍රියාදාමයක අවශ්‍යතාවය වඩාත් ඉස්මතු වන්නේ යුධ විරෝධී බව, නිදහස, සාමය, සමාජ සාධාරණත්වය, එදා මෙන්ම වර්තමාන සමාජයට ද අවශ්‍ය වී ඇති බැවිනි. එහෙයින් එබඳු ව්‍යාපාරයක් කෙරෙහි අවධානය යොමු කිරීම වඩාත් වැදගත් කොට සැලකුවෙමි. ඒ අනුව, මෙම නිබන්ධනයේ පරමාර්ථය වනුයේ, සූරියමල් ව්‍යාපාරය පිළිබඳව විස්තරාත්මක තොරතුරු ඉදිරිපත් කිරීමත්, එමගින් ව්‍යාපාරයේ ආරම්භය, එහි නායකත්වය, ගමන් මග සහ ව්‍යාපාරයේ වැදගත්කම පිළිබඳව අධ්‍යනයක් කිරීමත් ය.

### ආශ්‍රෙය ග්‍රන්ථ


ගුණවර්ධන, ලෙස්ලි,1978, ලංකා සමසමාජ පක්ෂය එහි ගමන්මග හා පසුබිම, කොළඹ, ආනන්ද ප්‍රකාශන. ප්‍රනාන්දු, ලක්සිරි, 1974,ජාතික ව්‍යාපාරය ව්‍යවස්ථා වර්ධනය හා වාමාංශික ව්‍යාපාරයේ උපත, නුගේගොඩ, දීපානි ප්‍රකාශන.

ජයවර්ධන, කුමාරි, 1976 ශ්‍රීලංකාවේ වාමාංශික ව්‍යාපාරයේ ආරම්භය. 1930 - 1935,කරුණාරත්න ප්‍රකාශන, කොළඹ.

Goonawardana, Lesli, 1960,A short History of the Lanka Sama Samaja party, Gunarathne and Company, Maradana.